# පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)

உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)

DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)


අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. LGD/2A/පොදු | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2020.03.28 |

බස්නාහිර පළාත්
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත.

**<u>Covid-19 වෛරසය හේතුවෙන් කොළඹ මැනිං වෙළෙඳපොළෙහි කටයුතු අඩාල වීම සම්බන්ධව යි.</u>**

ශ්‍රී ලංකාව තුළ පැතිර යන Covid-19 හෙවත් නව කෝරෝනා වෛරසය හේතුවෙන් මේ වනවිට මුලු දිවයිනට ම බලපාන පරිදි ඇඳිරි නීතිය පනවා ඇත. ඒ හේතුවෙන් අඩාළ වූ ජනජීවිත නගාසිටුවීමේ අරමුණින් කරුණු සලකා අත්‍යවශ්‍ය කටයුතු පමණක් ඉටුකරගැනීමට ඇඳිරි නීතියට අදාළ නීතිරීති ලිහිල් කරන ලදී. එහෙත් මහජනතාව එම තත්ත්වය අයුතු ලෙස ප්‍රයෝජනයට ගනිමින් ඇඳිරි නීතියට අදාළ නීතිරීති උල්ලංඝනය වන පරිදි කටයුතු කළ බැවින් ඇඳිරි නීති සමයෙහි නීතිරීති ලිහිල් කිරීම මහජනතාවගේ ම ආරක්ෂාව වෙනුවෙන් ඉවත්කිරීමට සිදුවිණි.

02. ඒ අනුව ආහාර තොග විකුණාගත නොහැකි වන සේ මැනිං වෙළෙඳපොළ කටයුතුවලට එම තත්ත්වය තදින් බලපා ඇත. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන කාර්ය සාධන බලකායේ සභාපති බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි එම එළවළු තොග මිලදීගැනීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරන ලෙස මා වෙත උපදෙස් ලබාදුණි.

03. එහෙයින් සියලු පළාත් පාලන ප්‍රධානීන් පහත දුරකථන අංකය හා සම්බන්ධවී මැනිං වෙළෙඳපොළෙහි එළවළු තොග මිලදීගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටුකරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

0773860161 - ප්‍රියන්ත

කසුන් ඇප් සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත) | - | කාරුණික දැ.ගැ.ස. |
| 02. | පළාත් පාලන ලේකම් (බස්නාහිර පළාත) | - | කාරුණික දැ.ගැ.ස. |
| 04. | පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) | - | පළාත් පාලන ආයතන හා සම්බන්ධීකරණය සඳහා |


| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla |
|---|---|

| දුරකථන / தொலைபேசி / Telephone | සාමාන්‍ය General | කොමසාරිස් Commissioner | පාලන හා මානව සම්පත් Admin / HR | නීති Legal | සැලසුම් Planning | ගිණුම් Accounts | විමර්ශන Investigation | ආයතන පරිපාලන Establishment | ප්‍රජා සංවර්ධන Community Development |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |

| ෆැක්ස් / பெக்ஸ்/ Fax | 2092577 | වෙබ් ලිපිනය/ வெப்தளம்/Web | www.lgd.wpc.gov.lk | ඊමේල් / மின்னஞ்சல்/ Email | lgd@wpc.gov.lk |
|---|---|---|---|---|---|